# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1262/32 - 2002 නොවැම්බර් 15 වැනි සිකුරාදා - 2002.11.15

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. බී. 21/78 (v).

**1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත**

1995 අංක 1 දරන විශ්ව විද්‍යාල ( සංශෝධන ) පනතින් අවසන් වරට සංශෝධිත 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 18 වන වගන්තිය සමඟ කියවිය යුතු 24අ වගන්තිය යටතේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

ලේකම්,
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව,

2002 සැප්තැම්බර් මස 01 දින දී ය.

නියමාවලිය

1. මේ නියමාවලිය 2002 අංක 01 දරන කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතන නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර එය 2002.09.01 දින සිට බලාත්මක වන්නේ ය.

2. (මෙහි මින් මතු "අධ්‍යයනායතනය" යනුවෙන් සඳහන් කරනු ලබන ) පරිසණක අධ්‍යයනායතනය (මෙහි මින් මතු "විශ්ව විද්‍යාලය" යනුවෙන් සඳහන් කරනු ලබන ) ශ්‍රී ලංකාවේ, කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධ වන්නේ ය.

3. (මෙහි මින් මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විධානයට සහ පාලනයට යටත්ව, පහත සඳහන් කටයුතු සඳහා බලය ඇත්තේ ය.–

(අ) ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීමට ;

(ආ) අධ්‍යයනායතනය සහ විශ්ව විද්‍යාලයේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන, පරිසණක විද්‍යාවේ සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශවල ඉගැන්වීමේ, පුහුණුකිරීමේ, පර්යේෂණ හා සංවර්ධන සහ උපදේශක සේවා සැපයීම :

(ඇ) විශ්ව විද්‍යාලයේ අනුමතය ඇතිව, පරිගණක විද්‍යාව සහ තොරතුරු හා සංනිවේදන තාක්ෂණයේ ප්‍රවීණතාව අත්කරගෙන සිටින තැනැත්තන් නිශ්චය කරගැනීමේ කාර්යය සඳහා විභාග පැවැත්වීම සහ ඒ විභාගවලින් සමත්ව, අතුරු ව්‍යවස්ථාවලින් නියමිත අනෙකුත් කොන්දේසි සපුරා, උපාධි, අභිඥාන පත්‍ර, සහතික සහ විශ්වවිද්‍යාලයේ වෙනත් ශාස්ත්‍රීය සාමාර්ථ ප්‍රදානය කරනු ලැබීම සඳහා සුදුස්සන්ව සිටින තැනැත්තන්, විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීමට ;

1A-G 002190 - 1,050 (2002/11)

(ඇ) විශ්ව විද්‍යාලයේ අනුමතය ඇතිව, සහ අවශ්‍ය අවස්ථාවලදී කොමිෂන් සභාවේ එකහත්වය ඇතිව, පරිගණක විද්‍යා සහ තොරතුරු හා සංනිවේදන තාක්ෂණය පිළිබඳව පිරිනැමිය යුතු උපාධි, අභිඥාන පත්‍ර, සහතික සහ වෙනත් ශාස්ත්‍රීය සාමාර්ථ්‍ය තීරණය කිරීමට ;

(ඉ) අධ්‍යයනායතනයේ පරමාර්ථවලට සමාන හෝ සාරානුකූලව සමාන පරමාර්ථ ඇති, ශ්‍රී ලංකාවේ හෝ විදේශීය වෙනත් විශ්ව විද්‍යාල හෝ ආයතන සමඟ, ආචාර්යවරයන්, ශිෂ්‍යයන් සහ ශාස්ත්‍රීධරයන් හුවමාරු කර ගැනීමෙන් හෝ අන්‍යාකාරව සහයෝගයෙන් ක්‍රියා කිරීමට :

(ඊ) අධ්‍යයනායතනයට ප්‍රවේශවීමට අපේක්ෂා කරන තැනැත්තන් විසින් වෙනත් විශ්ව විද්‍යාලවල දී සහ විශ්ව විද්‍යාල මට්ටමේ අධ්‍යයන ආයතනවල දී සමත් විභාග සහ ගත කළ අධ්‍යයන කාල සීමා හෝ හැදෑරූ අධ්‍යයන විෂය, අතුරු ව්‍යවස්ථා මගින් නියමකරනු ලැබිය හැකි පරිදි, අධ්‍යයනායතනයේ යම් විභාග වලට සහ ඉගෙනීමේ හෝ අධ්‍යයන කාලසීමාවලට හෝ ඉන් යම් කොටසකට හෝ සමාන බවට පිළිගැනීමට විශ්ව විද්‍යාලයේ සනාතන සභාවට නිර්දේශ කිරීම සහ ඕනෑම අවස්ථාවක එම පිළිගැනීම ඉවත් කර ගැනීමට ;

(උ) විශ්ව විද්‍යාලයේ අනුමතය ඇතිව ඉගැන්වීමේ, පුහුණු කිරීමේ, පර්යේෂණ කිරීමේ, සංවර්ධනය කිරීමේ හෝ උපදේශක කාර්ය සඳහා පුස්තකාල, රසායනාගාර හා වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම, ඒවාට උපකරණ සැපයීම හා ඒවා පවත්වා ගෙන යාම ;

(ඌ) අධ්‍යයනායතනයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි ආචාර්ය තනතුරු, පරිපාලන තනතුරු හා වෙනත් තනතුරු ඇති කිරීමට, විශ්ව විද්‍යාලයට නිර්දේශ කිරීම සහ එම තනතුරු අහෝසි කිරීම හෝ තාවකාලිකව අත්හිටුවීම සඳහා විධිවිධාන සැළසීමට ;

(එ) අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව ජාත්‍ර දක්ෂිණ, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් සහ වෙනත් ත්‍යාග ඇතිකිරීමට සහ පිරිනැමීමට;

(ඒ) අධ්‍යයන පාඨමාලා හෝ අධ්‍යයන පාඨමාලා වලින් කොටසක් අධ්‍යයනායතනයෙන් බාහිරව පැවැත්වීම සඳහා විධිවිධාන යෙදිය යුතු යැයි නියම කෙරෙන යම් අතුරු ව්‍යවස්ථාවකට අනුකූලව පාඨමාලා හෝ පාඨමාලාවලින් කොටසක් හෝ බාහිරව පැවැත්වීමට කටයුතු පිළියෙල කිරීමට ;

(ඔ) ආණ්ඩුවේ ප්‍රතිපත්තියට සහ ගාස්තු ගෙවීම නියම කෙරෙන යම් රීතියකට අනුකූලව ගාස්තු ඉල්ලා සිටීම හා ලබාගැනීමට : සහ ;

(ඕ) අධ්‍යයනායතනයේ පරමාර්ථ ඉටුකර ගැනීම පිණිස ඉහත කී බලතල, කාර්ය හා කර්තව්‍යවලට ආනුෂංගික හෝ ඒ හේතුවෙන් අවශ්‍ය වන වෙනත් සියලු ක්‍රියා හා දේ කිරීම.

4. අධ්‍යයනායතනය පහත සඳහන් අංශවලින් සමන්විත විය යුතු ය :—

(i) කළමනාකරණ මණ්ඩලය ;
(ii) ශාස්ත්‍රීය කමිටුව ;
(iii) අධ්‍යයන මණ්ඩල ;
(iv) අධ්‍යයන අංශ ;
(v) මධ්‍යස්ථාන ; සහ
(iv) අධ්‍යයනායතනයේ බලධරයන් ලෙස නියමාවලිය මගින් නියම කරනු ලැබිය හැකි වෙනත් පුද්ගල මණ්ඩල.

5. අධ්‍යයනායතනයට පහත සඳහන් නිලධරයන් සිටිය යුතු ය :—

(i) අධ්‍යක්ෂවරයා ;
(ii) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ;
(iii) මේ ඡේදයේ කාර්ය සඳහා වන තනතුරක් ලෙස නියමාවලිය මගින් ප්‍රකාශ කෙරෙන වෙනත් යම් තනතුරක් දරන්නා.

6. (1) අධ්‍යයනායතනයේ ප්‍රථම අධ්‍යක්ෂවරයා, විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයාගේ නිර්දේශය මත, පාලක සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය. ඉන්පසුව, සෑම අධ්‍යක්ෂවරයකුම, කළමණාකරණ මණ්ඩලය නිර්දේශ කරන තැනැත්තන් තිදෙනකුගේ මූල මණ්ඩලයෙන්, පාලක සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය. ;

එසේ වුවද කිසිම තැනැත්තකු අනුක්‍රමික ධූර කාල දෙකකට වඩා අධ්‍යක්ෂවරයා ලෙස පත් කරනු නොලැබිය යුතු ය :

එසේම තවදුරටත් අධ්‍යක්ෂවරයා පත් කිරීම සම්බන්ධව කොමිෂන් සභාවේ එකහත්වය ලබාගත යුතු ය.

(2) අධ්‍යක්ෂවරයා කලින් ධූරය අත්හැරියහොත් මිස හෝ (3) වන අනුඡේදයේ විධිවිධාන වලින් සලස්වා ඇති පරිදි ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, පත්කරනු ලැබූ දින සිට ගණන් බලනු ලබන වර්ෂ තුනක කාලයක් ගත වීම හෝ ඔහුට හැටපස් වන විය සම්පූර්ණ වීමහෝ යන මෙයින් කලින් එළඹෙන දිනය තෙක් ධූරය දරන්නේ ය. ;

(3) දෝෂාරෝපණ යෝජනාවක් සම්මත කරගැනීම සඳහා කැඳවනු ලැබූ කළමනාකරණ මණ්ඩලයේ විශේෂ රැස්වීමක දී එම මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවකගේ ඡන්දයෙන් සම්මත කර ගනු ලබන දෝෂාරෝපණ යෝජනාවක් අනුව කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශය මත පාලක සභාව විසින් අධ්‍යක්ෂවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය. ;

(4) ධුරයෙන් ඉවත් කරන ලද හෝ ධුරයෙන් ඉල්ලා අස්වන අධ්‍යක්ෂවරයෙකු, අධ්‍යක්ෂවරයා වශයෙන් පත් කරනු ලැබීමට ඉහතින් ම උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලයේ සාමාජිකයකුව සිටියේ නම් සහ ඔහු පනතේ දැක්වෙන විශ්‍රාම ගැනීමේ වයසට එළඹී නොමැති නම්, එකී උසස් අධ්‍යාපන ආයතනයේ ඔහුගේ නිත්‍ය තනතුරට ඔහුට පෙරලා පැමිණිය හැකිය.;

(5) අධ්‍යක්ෂවරයා රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා ඔහුට ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක, එසේ කාර්ය ඉටු කිරීමට නොහැකි වීමෙන් දින හතක් ඇතුළත, ඒ ධුරයේ කාර්යය ඉටු කිරීම සඳහා සුදුසු යයි උපකුලපතිවරයා අදහස් කරන වැඩ පිළිවෙලක් යෙදිය යුතු අතර එසේ පිළිවෙලක් යොදන තෙක් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ඒ ධුරයේ එදිනෙදා කාර්ය කරගෙන යා යුතුය.

(6) අධ්‍යක්ෂ ධුරයෙහි යම් පුරප්පාඩුවක් ඇති වුවහොත් ඒ පුරප්පාඩුව ඇති වී දින හතක් ඇතුළත, අධ්‍යක්ෂ ධුරයේ කාර්ය ඉටු කිරීම සඳහා සුදුසු යයි උපකුලපතිවරයා අදහස් කරන වැඩ පිළිවෙලක් උපකුලපතිවරයා විසින් යෙදිය යුතු අතර, එසේ වැඩ පිළිවෙලක් යොදන තෙක්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා අධ්‍යක්ෂවරයාගේ කාර්ය ඉටු කල යතුය.

7. (1) අධ්‍යක්ෂවරයා අධ්‍යයනායතනයේ ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන ශාස්ත්‍රීය නිලධාරියා වන්නේය. ඔහු නිල බලයෙන් කළමනාකරණ මණ්ඩලයේ, ශාස්ත්‍රී කමිටුවේ සහ අධ්‍යයනායතනයේ සියලුම මණ්ඩලවල සාමාජිකයෙකු විය යුතුය. අධ්‍යයනායතනයේ වෙන යම් බලමණ්ඩලයක හෝ පුද්ගල මණ්ඩලයක යම් රැස්වීමකට පැමිණ සිටීමට හා ඒ රැස්වීමේදී කථා කිරීමට අධ්‍යක්ෂවරයාට හිමිකම ඇති නමුත්, ඔහු ඒ බලමණ්ඩලයේ හෝ පුද්ගල මණ්ඩලයේ සාමාජිකයකු වන්නේ නම් මිස ඒ යම් රැස්වීමක දී ඡන්දය දීමට ඔහුට හිමිකම් නොමැති වියුතුය.

(2) මණ්ඩලය විසින් කලින් කල තත් කාර්යය සඳහා නීත්‍යානුකූලව, තමා වෙත නිකුත් කරනු ලැබිය හැකි විධානවලට අනුකූලව, නියමාවලියේ, පනතේ සහ වෙනත් යම් සාධන පත්‍රයක විධිවිධාන, අධ්‍යයනායතනයට අදාල වන තාක් දුරට, ඒ විධිවිධාන යථා පරිදි, පිළිපැදින බවට වගබලා ගැනීම අධ්‍යක්ෂවරයාගේ කාර්ය වන්නේය. තවද ඒ කාර්ය සඳහා අවශ්‍ය යයි ඔහු විසින් සලකනු ලබන සියලු බලතල ඔහුට ඇති අතර, ඒ බලතල ඔහු විසින් ක්‍රියාත්මක කළ හැකිය.

(3) කළමනාකරණ මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කිරීමට සැලැස්වීම අධ්‍යක්ෂවරයාගේ කාර්යය විය යුතුය.

(4) අධ්‍යක්ෂවරයා අධ්‍යයනායතනයේ ගණන් තැබීමේ නිලධරයා වන්නේය.

(5) විශ්ව විද්‍යාලයේ උප කුලපතිවරයාගේ විධානය යටතේ, අධ්‍යයනායතනය තුළ විනය පවත්වා ගැනීම පිළිබඳව අධ්‍යක්ෂවරයා වගකිව යුතුය. විනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා නොමැති නම්, විශ්ව විද්‍යාලයේ උචිත අතුරු ව්‍යවස්ථා සහ වෙනත් රීති අදාළ විය යුතුය

8. (1) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා, අධ්‍යයනායතනයේ අධ්‍යයන අංශ ප්‍රධානීන් අතුරෙන්, කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශය මත උප කුලපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතුය.

(2) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා කලින් ධුරය අතහැර ගියහොත් හෝ (3) වන අනුඡේදය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, පත් කරනු ලැබූ දින සිට වර්ෂ තුනක කාලයක් හෝ ඔහුට හැටපස්විය සම්පූර්ණ වීම යන මෙයින් කලින් එළඹෙන දිනය දක්වා ඔහු ධුරය දරන්නේය.

(3) දෝෂාරෝපණ යෝජනාවක් සම්මත කර ගැනීම සඳහා කැඳවනු ලැබූ කළමනාකරණ මණ්ඩලයේ විශේෂ රැස්වීමකදී එම මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්ද සංඛ්‍යාවකින් සම්මත කර ගනු ලැබූ දෝෂාරෝපණ යෝජනාවක් අනුව කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශය මත පාලක සභාව විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂවරය් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

(4) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාගේ කාර්ය සහ කර්තව්‍ය කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි විය යුතුය.

9. (මෙහි මින් මතු " මණ්ඩලය " යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලය, අධ්‍යයතනායතනයේ ශාස්ත්‍රීය හා විධායක මණ්ඩලය වන අතර එය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය. :—

(1) නිල බලයෙන් පත් වන සාමාජිකයන් අට දෙනෙකුගෙන්, එනම්.:—

(අ) අධ්‍යක්ෂවරයා; ඔහු මණ්ඩලයේ සභාපති විය යුතුය.

(ආ) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ;

(ඇ) විශ්ව විද්‍යාල අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයා :

(ඈ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයා;

(ඉ) විශ්ව විද්‍යාලයේ විද්‍යාපීඨයේ පීඨාධිපතිවරයා

(ඊ) අධ්‍යයනායතනයේ අධ්‍යයන අංශ ප්‍රධානීන් ; සහ

(2) තවත් සාමාජිකයන් එකොළොස් දෙනෙක්, එනම් :-

(අ) විශ්ව විද්‍යාල පාලක සභාව විසින් එහි සාමාජිකයන් අතරින් පත් කරන සාමාජිකයන් දෙදෙනෙක් :

(ආ) විශ්ව විද්‍යාල සනාතන සභාව විසින් එහි සාමාජිකයන් අතරින් නම්කර විශ්ව විද්‍යාල පාලක සභාව විසින් පත් කරන සාමාජිකයන් දෙදෙනෙක් :

(ඇ) කොමිෂන් සභාව විසින් පත් කරන සාමාජිකයන් දෙදෙනෙක් :

(ඈ) තොරතුරු තාක්ෂණ කර්මාන්තය නියෝජනය කිරීම සඳහා, උප කුලපතිවරයාගේ නිර්දේශය මත විශ්ව විද්‍යාලයේ පාලක සභාව පත් කරන සාමාජිකයන් දෙදෙනෙක් සහ

(ඉ) ශාස්ත්‍රීය කමිටුව විසින් එහි සාමාජිකයන් අතරින් නම් කරන සාමාජිකයන් තිදෙනෙක්.

10. (1) අධ්‍යක්ෂවරයා මණ්ඩලයේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතුය. මණ්ඩලයේ යම් රැස්වීමකට අධ්‍යක්ෂවරයා නොපැමිණියහොත් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා මුලසුන දැරිය යුතුය. අධ්‍යක්ෂවරයා සහ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා දෙදෙනාම පැමිණ නොමැති විටෙක මණ්ඩලයේ සාමාජිකයන් විසින් පැමිණ සිටින සාමාජිකයන් අතුරෙන් යම් සාමාජිකයෙකු ඒ රැස්වීමේ මූලාසනය දැරීම සඳහා තෝරා පත් කර ගත යුතුය.

(2) යම් නම් කළ හෝ පත් කළ සාමාජිකයකු, කලින් ධූරය අත්හැරියහොත් මිස, නම්, කරනු ලැබූ හෝ පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ධූරය දැරිය යුතු අතර, ධූරයෙන් ඉවත්කරනු ලැබුවහොත් මිස, නැවත නම් කරනු ලැබීමට හෝ නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙකු විය හැකිය.

එසේ වුවද, යම් නම් කරනු ලැබූ හෝ පත් කරනු ලැබූ හෝ සාමාජිකයෙකු ඔහුගේ ධූර කාලය ඉකුත්වීමට ප්‍රථම ධූරය අත්හැර ගියහොත්, ඔහුගේ අනුප්‍රාප්තිකයා විසින් තමා ද කලින් ධූරය අත්හැර ගියහොත් මිස, තම පූර්වගාමියාගේ ධූර කාලයෙන් නොගෙවී ඇති ඉතිරි කාලය තුළ ධූරය දරන්නේය..

එසේම තවදුරටත්, එක් එක් නම් කරනු ලැබූ හෝ පත් කරනු ලැබූ හෝ සාමාජිකයා මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත්කරනු ලැබුයේ යම් තරාතිරමක් ප්‍රකාරව ද එය දරන තාක් කල් මණ්ඩලයේ සාමාජික ධූරය දරන්නේය.

(3) මණ්ඩලයේ යම් නම් කරනු ලැබූ හෝ පත් කරනු ලැබූ සාමාජිකයෙකු විසින්, අවස්ථාවෝචිත පරිදි කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත හෝ විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා වෙත හෝ යවන ලිඛිත ඉල්ලීමක් මගින් සාමාජික ධූරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(4) මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයෙකු අවසරය නොලබා, මණ්ඩලයේ අනුක්‍රමික රැස්වීම් තුනකට පැමිණීම පැහැර හැරියහොත්, ඔහු මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් ධූරය අත්හැරිය සේ සලකිය යුතු අතර, පත් කිරීමේ බලධරයා විසින්, යෝග්‍ය තැනැත්තෙකු ඉන් ඇතිවන පුරප්පාඩුව සඳහා පත් කළ යුතුය.

(5) මණ්ඩලයේ සාමාජිකයෙකුට, කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි දීමනාවක් ගෙවිය යුතුය.

(6) කවර හෝ රැස්වීමක් සඳහා ගණපූරණය වන අවම සංඛ්‍යාව එහි මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකට වඩා අඩු නොවිය යුතුය.

(7) මණ්ඩලය අවශ්‍ය වන කවර අවස්ථාවක වුවද, රැස්විය යුතුය. එසේ වුවද එක් වර්ෂයක් තුළ මණ්ඩලය අට වාරයකට නොඅඩු වාර සංඛ්‍යාවක් රැස්විය යුතුය.

(8) අධ්‍යක්ෂවරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන කවර හෝ අවස්ථාවකදී හෝ මණ්ඩලයේ මුළු සාමාජිකත්වයෙන් තුනෙන් දෙකකට නොඅඩු සාමාජික සංඛ්‍යාවක් විසින් ඉදිරිපත් කරන ලද ලියවිල්ලක් මගින් අධ්‍යක්ෂවරයා වෙත ලැබී දින 07 ක් ඇතුළත හෝ මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතු අතර, ඒ විශේෂ රැස්වීමෙහි කාර්යය ඒ ඉල්ලීමෙහි අන්තර්ගත විය යුතු ය.

11. (1) පනතේ සහ යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව, පහත සඳහන් කාර්ය සඳහා මණ්ඩලයට බලය තිබිය යුතු ය :—

(අ) අධ්‍යයනායතනයේ චංචල හෝ නිශ්චල දේපළ දැරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම :

(ආ) පනතේ සහ වෙනත් යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට අනුකූලව, අධ්‍යයනායතනය හා සම්බන්ධ කාරණා විධිමත් කිරීම හා නිශ්චය කිරීම :

(ඇ) අධ්‍යයනායතනයේ සාමාන්‍ය පරිපාලනය සහ කළමනාකරණය සඳහා සහ වෙනත් යම් නිශ්චිත කාර්යයයක් සඳහා අධ්‍යයනායතනයට ලබා දෙන අරමුදල් පරිපාලනය හා පාලනය කිරීම :

(ඇ) අධ්‍යයනායතනයට අන්තිම කැමති පත්‍ර මගින්, පරිත්‍යාග මගින් සහ වෙනත් ප්‍රදාන වශයෙන් ලැබෙන චංචල හෝ නිශ්චල දේපළ කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව භාර ගැනීම සහ පිළිගැනීම :

(ඉ) අධ්‍යයනායතනයේ වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම් සලකා බැලීම සහ එම වාර්තාව සහ ගිණුම්, විශ්ව විද්‍යාලයට සහ කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම :

(ඊ) අවශ්‍ය වර්ෂය සඳහා අධ්‍යයනායතනයේ ඇස්තමේන්තු පිළියෙල කිරීමට සැලැස්වීම සහ අනුමත කිරීමෙන් පසුව එම ඇස්තමේන්තු විශ්ව විද්‍යාලයට සහ කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම :

(උ) ශාස්ත්‍රීය කමිටුව විමසා පරිගණක විද්‍යාව, තොරතුරු හා සංනිවේදන තාක්ෂණය සම්බන්ධයෙන් ප්‍රදානය කරනු ලැබිය යුතු උපාධි, අභිඥාන පත්‍ර, සහතික සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා සහ එවැනි සහතික හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා සඳහා සුදුසුකම් ලැබීම පිණිස අනුගමනය කළයුතු අධ්‍යයන පාඨමාලා සහ පුහුණු පාඨමාලා, සමත් විය යුතු විභාග සහ සපුරාලිය යුතු අනෙකුත් කොන්දේසි, විශ්ව විද්‍යාලය වෙත නිර්දේශ කිරීම :

(ඌ) අතුරු ව්‍යවස්ථා සහ රීති සාදනු ලැබීමට බලය දී ඇති කවර හෝ කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා සහ රීති සෑදීම :

එසේ වුවද ශාස්ත්‍රීය කමිටුවේ වාර්තාව සලකා බැලීමෙන් පසුව මිස, අධ්‍යයන පාඨමාලා සහ විභාග සම්බන්ධ අතුරු ව්‍යවස්ථා හෝ රීති කිසිවක් සාදනු නොලැබිය යුතු ය.

(එ) අධ්‍යයනායතනයේ කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ගොඩනැගිලි, භූමිභාග, ලීබඩු, උපකරණ සහ වෙනත් ද්‍රව්‍ය සැපයීම :

(ඒ) විශ්ව විද්‍යාලය වෙත :

(i) ආචාර්ය ධූර සහ පරිපාලන ධූර ද ඇතුළුව අධ්‍යයනායතනයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි ධූර ඇති කිරීම සහ ඒවා අහෝසි කිරීම හෝ අත්හිටුවීම නිර්දේශ කිරීම :

(ii) අධ්‍යයනායතනයට පත් කරනු ලබන ආචාර්යවරුන්ට නිලධරයන්ට සහ වෙනත් සේවා නියුක්තයන්ට තිබිය යුතු සුදුසුකම් නිර්දේශ කිරීම :

(iii) අවශ්‍ය අවස්ථාවලදී අධ්‍යයනායතනයේ සේවයේ නියුක්ත තැනැත්තන්ගේ සේවය තාවකාලිකව අත්හිටුවීමට, ඔවුන් සේවයෙන් පහ කිරීමට හෝ ඔවුන්ට අන්‍යාකාරව දඬුවම් කිරීමට කටයුතු කරන ලෙස නිර්දේශ කිරීම :

(iv) අධ්‍යයනායතනයේ ආචාර්යවරුන් සහ පරීක්ෂකවරුන් ලෙස පත්කිරීම සඳහා සුදුසුකම් ඇති තැනැත්තන් නිර්දේශ කිරීම :

(ඔ) සුදුසුයයි සලකනු ලබන ස්ථාවර කමිටු හෝ තත් කාර්ය කමිටු සංඛ්‍යාවක් පත් කිරීම, ඒවායේ නිර්ණේය විෂයයන් නියම කිරීම, වාර්තා සලකා බැලීම හා වෙනස් කිරීම් සහිතව හෝ රහිතව ඒ වාර්තා අනුමත කිරීම හෝ ඒ වාර්තා ප්‍රතික්ෂේප කිරීම :

(ඕ) ශාස්ත්‍රීය කමිටුව විමසා, සහ විශ්ව විද්‍යාලයේ සහ කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව කොමිෂන් සභාව විසින් පනතේ 15 වන වගන්තියේ (VII) ඡේදය යටතේ තෝරා ගන්නා ශිෂ්‍යයන් හැර, අධ්‍යයන පාඨමාලාවලට ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම සඳහා තිබිය යුතු සුදුසුකම්, තීරණය කිරීම :

(ක) නොයොදවා ඇති යම් ආදායමක් ද ඇතුළුව අධ්‍යයනායතනයට අයත් කවර මුදලක් වුව ද භාර ආඥාපනතේ 20 වන වගන්තියේ විධිවිධාන යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ආයෝජනය කිරීම නීත්‍යානුකූල වන්නාවූ යම් සුරැකුම් පතක ආයෝජනය කිරීම නැතහොත් කොමිෂන් සභාවේ අනුමතය ඇතිව ශ්‍රී ලංකාව තුළ නිශ්චල දේපළ මිලට ගැනීම සඳහා එවැනි මුදලක් ආයෝජනය කිරීම හෝ එවැනි ආයෝජන වෙනස් කිරීම හෝ ඒ මුදල්වලින් වියදම සඳහා වහා අවශ්‍ය නොවන යම් මුදල් ප්‍රමාණයක් කොමිෂන් සභාව අනුමත කරන යම් බැංකුවක ස්ථිර තැන්පතුවක් ලෙස තැන්පත් කිරීම :

(ග) මේ නියමාවලී මගින් හෝ වෙනත් යම් උචිත සාධන පත්‍රයක විධිවිධාන සලසා ඇති පරිදි අධ්‍යයනායතනයේ බලතලවල ප්‍රතිඵලයක් වන හෝ බලතලවලට ආනුෂංගික වන අධ්‍යයනායතනයේ වෙනත් සියලු බලතල ක්‍රියාත්මක කිරීම.

(2) ශාස්ත්‍රීය කාරණයක් හා සම්බන්ධ කිසිදු යෝජනාවක්, ඒ පිළිබඳව ස්වකීය මතය වාර්තාගත කර මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට ශාස්ත්‍රීය කමිටුවට අවස්ථාවක් දී ඇත්නම් මිස, මණ්ඩලය විසින් සම්මත කරනු නොලැබිය යුතු ය :

එසේ වුවද විශ්ව විද්‍යාලයේ එකඟත්වය ඇතිව මිස එසේ සම්මත කරන කිසිම යෝජනාවක් මත ක්‍රියා කිරීම නොකළ යුතු ය.

මේ ඡේදයෙහි "ශාස්ත්‍රීය කාරණය" යන්නෙන් ශාස්ත්‍රීය කමිටුවේ පාලනයට හා සාමාන්‍ය විධානයට යටත් යම් කාරණයක් අදහස් වේ.

12. (1) පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ශාස්ත්‍රීය කමිටුවක් වන්නේ ය :—

(අ) අධ්‍යක්ෂවරයා : ඔහු සභාපතිවරයා විය යුතු ය :

(ආ) එක් එක් අධ්‍යයන අංශයේ ප්‍රධානයා :

(ඇ) එක් එක් අධ්‍යයන මණ්ඩලයේ නාමිකයෙක් :

(ඈ) එක් එක් මධ්‍යස්ථානයේ සමායෝජක හෝ ඔවුන්ගේ නාමිකයන් :

(ඉ) විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්, මහාචාර්යවරුන්, සහාය මහාචාර්යවරුන් හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් අතරින් තෝරාගත්, විද්‍යා පීඨයේ පීඨ මණ්ඩලයේ නාමිකයා :

(ඊ) තොරතුරු තාක්ෂණ කර්මාන්තය නියෝජනය සඳහා මණ්ඩලයේ නිර්දේශය මත උපකුලපතිවරයා පත් කරන සාමාජිකයන් දෙදෙනෙක් :

(උ) අධ්‍යයනායතනයේ එක් එක් අධ්‍යයන අංශයෙන් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්, මහාචාර්යවරුන්, සහාය මහාචාර්යවරුන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්,

(ඌ) මෙහි පහත (උ) ඡේදයේ සඳහන් තැනැත්තන් නොවන, අධ්‍යයනායතනයේ ඉගැන්වීමේ කටයුතුවල නිරත ස්ථිර කාර්ය මණ්ඩලයෙන් තෝරා පත් කරන සාමාජිකයන් දෙදෙනෙක් ;

(2) ශාස්ත්‍රීය කමිටුව විසින්, මණ්ඩලයේ එකඟත්වය ඇතිව, නිශ්චිත කාර්යයන් සඳහා සහ නිශ්චිත කාලසීමාවක් සඳහා තැනැත්තන් එක්කෙනෙකු හෝ වැඩි සංඛ්‍යාවක් වැඩිපුර එක් කර ගත හැකි නමුත් එසේ වැඩිපුර එක් කර ගන්නා ලද තැනැත්තෙකුට ශාස්ත්‍රීය කමිටුවේ ඡන්ද විමසීමකදී ඉදිරිපත් වීමට හෝ යම් රැස්වීමකදී ඡන්දය දීමට හෝ අයිතියක් නොමැති විය යුතු ය.

(3) 10 වන ඡේදයේ (2) (3) සහ (4) වන අනුඡේදවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ශාස්ත්‍රීය කමිටුවේ එක් එක් පත්කළ හෝ නම් කළ සාමාජිකයාට සහ ඒ සාමාජිකයකු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) ශාස්ත්‍රීය කමිටුවේ රැස්වීමක් සඳහා අවම ගණපූරණය එහි සම්පූර්ණ සාමාජිකත්වයෙන් තුනෙන් දෙකකට අඩු නොවිය යුතු ය.

(5) ශාස්ත්‍රීය කමිටුව අවශ්‍ය කවර හෝ අවස්ථාවක රැස්විය යුතු අතර එක් එක් වර්ෂය තුළ දස වතාවකට නොඅඩු වාර ගණනක් රැස්විය යුතු ය.

(6) ශාස්ත්‍රීය කමිටුවේ සාමාජිකයකුට, කොමිෂන් සභාව නිශ්චය කරන පරිදි වූ දීමනා ගෙවනු ලැබිය යුතු ය.

13. (1) මේ පනතේ විධිවිධානවලට සහ යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව, අධ්‍යයනායතනයේ ඉගැන්වීම, පුහුණු කිරීම, පර්යේෂණ සහ විභාග පිළිබඳ පාලනය සහ සාමාන්‍ය විධානය ශාස්ත්‍රීය කමිටුව සතු විය යුතු ය.

(2) (1) වන අනුඡේදයෙන් ශාස්ත්‍රීය කමිටුවට පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, ශාස්ත්‍රීය කමිටුව විසින් ;

(අ) මණ්ඩලය විසින් යොමු කරනු ලබන යම් කාරණයක් සලකා බලා ඒ පිළිබඳ වාර්තා කළ යුතු ය ;

(ආ) අධ්‍යයන පාඨමාලා, ඉගැන්වීමේ වැඩ සටහන්, පුහුණු කිරීමේ වැඩ සටහන්, පර්යේෂණ වැඩ සටහන් හෝ විභාග සම්බන්ධ කාරණා නොවන කාරණ සම්බන්ධව මණ්ඩලය වෙත නිර්දේශ හා වාර්තා ඉදිරිපත් කළ යුතු ය ;

(ඇ) යම් විශේෂ විෂයයක් හෝ විෂයයන් පිළිබඳව සලකා බලා වාර්තා කිරීමේ කාර්යය සඳහා ශාස්ත්‍රීය කමිටුවේ සාමාජිකයන් නොවන තැනැත්තන්ද ඇතුළත් විය හැකි කමිටු පත්කළ හැකි ය :

(ඈ) මණ්ඩලය වෙත-

(i) අධ්‍යයන පාඨමාලා සඳහා ශිෂ්‍යයන් ඇතුළත් කිරීම සහ විභාග සඳහා නියමයන් නිර්දේශ කළ යුතු ය :

(ii) ආචාර්යවරයන් හෝ පරීක්ෂකයන් ලෙස පිළිගැනීමට යෝග්‍ය තැනැත්තන් නිර්දේශ කළ යුතු ය :

(iii) නියමිත විභාග සමත්ව අනෙකුත් නියමිත කොන්දේසි සම්පූර්ණ කර, උපාධි. අභිඥාන පත්‍ර, සහතික සහ වෙනත් ශාස්ත්‍රීය සාමාර්ථතා පිරිනැමිය යුතු තැනැත්තන් නිර්දේශ කළ යුතු ය :

(iv) අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ජාත්‍ර දක්ෂිණ, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් සහ වෙනත් ත්‍යාග සඳහා තරඟ කෙරෙන ආකාරය සහ ඊට අදාළ කොන්දේසි නිර්දේශ කළ යුතු ය

(v) අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ජාත්‍ර දක්ෂිණ, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් හා වෙනත් ත්‍යාග පිරිනැමීමට සුදුසු තැනැත්තන් නිර්දේශ කළ යුතු ය. තවද

(iv) මෙම නියමාවලියේ හෝ වෙනත් උචිත සාධක පත්‍රයක අධ්‍යායනායතනයේ බලතල පිළිබඳව ඇති විධිවිධානවලට ආනුෂංගික හෝ ඒ විධිවිධානවල ප්‍රතිඵලයක් වන ශාස්ත්‍රීය කාරණ වලට අදාළ අනෙකුත් සියලු බලතල ක්‍රියාත්මක කළ යුතුය

14. (1) (අ) පර්යේෂණ සහ ඉහල උපාධි ;
(ආ) අභ්‍යන්තර උපාධි අපේක්ෂක උපාධි ; සහ
(ඇ) බාහිර හා ව්‍යාප්ති වැඩ සටහන් සඳහා අධ්‍යයන මණ්ඩල තිබිය යුතු ය.

(2) මණ්ඩලයේ නිර්දේශ මත, විශ්ව විද්‍යාලය විසින්, කොමිෂන් සභාවේ එකඟත්වය සහිතව, අතිරේක අධ්‍යයන මණ්ඩල ඇති කරනු ලැබිය යුතු ය.

(3) අධ්‍යක්ෂවරයා එක් එක් අධ්‍යයන මණ්ඩලයේ ප්‍රධානයා විය යුතු ය.
(4) අධ්‍යයන මණ්ඩලවල සාමාජිකයන්ට මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි පාරිශ්‍රමික ගෙවිය යුතුය.

15. (1) පර්යේෂණ හා ඉහළ උපාධි සඳහා වන අධ්‍යයන මණ්ඩලය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය.

(අ) අධ්‍යක්ෂවරයා ; ඔහු සභාපතිවරයා විය යුතු ය
(ආ) එක් එක් අධ්‍යයන අංශයේ ප්‍රධානයා
(ඇ) පර්යේෂණ හා සංවර්ධන පශ්චාත් උපාධි සඳහා ඉගැන්වීමේ නිරත මධ්‍යස්ථාන අතර සමායෝජකයන්
(ඈ) එක් එක් අධ්‍යයන අංශයෙන් නම් කරන එක් නියෝජිතයකු බැගින් සහ පර්යේෂණ හා සංවර්ධන හෝ පශ්චාත් උපාධි සඳහා ඉගැන්වීමේ එක් එක් මධ්‍යස්ථානයේ නියෝජිතයකු බැගින්

(ඉ) හඳුනාගත් එක් එක් වැඩ සටහන සම්බන්ධීකරණය සඳහා ශාස්ත්‍රීය කමිටුව විසින් පත් කළ සාමාජිකයන්.
(2) අභ්‍යන්තර උපාධි අපේක්ෂක උපාධි සඳහා වන අධ්‍යයන මණ්ඩලය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය.

(අ) අධ්‍යක්ෂවරයා ; ඔහු සභාපතිවරයා විය යුතු ය.;
(ආ) එක් එක් අධ්‍යයන අංශයේ ප්‍රධානයා
(ඇ) සියලු ස්ථිර ආචාර්යවරු
(ඈ) අධ්‍යයනායතනයේ ඉගැන්වීමේ නියුක්ත, විද්‍යා පීඨයේ සාමාජිකයන් අතරින් නම් කරන, විද්‍යා පීඨයේ මණ්ඩලයේ නියෝජිතයෙක්
(ඉ) උපාධි අපේක්ෂකයන්ට ඉගැන්වීමේ නියුතු සියලු ස්ථිර උපදේශකවරු
(ඊ) අධ්‍යයනායතනයේ ලියාපදිංචි උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් අතරින් තෝරා පත් කර ගන්නා ශිෂ්‍යයන් දෙදෙනෙක්.

(3) (2) වන උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ තෝරා පත් කර ගන්නා ලද සාමාජිකයකු, ලියාපදිංචි උපාධි අපේක්ෂක අභ්‍යන්තර ශිෂ්‍යයකු ලෙස තවදුරටත් සිටින්නේ නම් පමණක් ඒ සාමාජිකයාට එක් අධ්‍යයන වර්ෂයක් සඳහා සාමාජිකයකු ලෙස ධූරය දැරිය හැකි ය. එසේ තෝරා පත් කර ගන්නා ලද සාමාජිකයකු, අධ්‍යයන මණ්ඩලයේ යම් රැස්වීමකදී විභාගවල හෝ ඒ හා සම්බන්ධව සිදු කෙරෙන කටයුතු වලින් බැහැර කළ යුතු අතර, එසේ බැහැර කරනු ලැබුවේ වුවද ඒ රැස්වීම යථා පරිදි පවත්වනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(4) බාහිර හා ව්‍යාප්ති වැඩ සටහන් පිළිබඳ අධ්‍යයන මණ්ඩලය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය.:—

(අ) අධ්‍යක්ෂවරයා ; ඔහු සභාපතිවරයා විය යුතු ය.

(ආ) එක් එක් මධ්‍යස්ථානයේ සමායෝජක හෝ ඔහුගේ නාමිකයා ;
(ඇ) එක් එක් අධ්‍යයන අංශයෙන් එක් නම් කරනු ලැබුවෙකු
(ඈ) එක් එක් අභ්‍යන්තර හා බාහිර වැඩ සටහන් සම්බන්ධීකරණ සඳහා ශාස්ත්‍රීය කමිටුව විසින් පත් කරන ලද සාමාජිකයන්.

16. (1) සෑම අධ්‍යයන මණ්ඩලයකටම ලේකම්වරයකු සිටිය යුතු අතර ඔහු එහි සාමාජිකයන් වන ස්ථිර ආචාර්යවරුන් විසින් ඔවුන් අතරින් තෝරා පත්කර ගනු ලැබිය යුතුය.

(2) කරව හෝ අධ්‍යයන මණ්ඩල රැස්වීමක ගණපූරණය සඳහා අවම සාමාජික සංඛ්‍යාව, අමතරව එකතු කරන ලද සාමාජිකයන් ඇත්නම් ඔවුන් අත්හැර සම්පූර්ණ සාමාජිකත්වයෙන් තුනෙන් එකකට අඩු නොවිය යුතු ය.

(3) සෑම අධ්‍යයන මණ්ඩලයක්ම, අවශ්‍ය කවර හෝ අවස්ථාවක රැස්විය යුතු අතර, කෙසේ වුවද වර්ෂයකට දස වතාවකට නොඅඩු වාර ගණනක් රැස්වීම යුතු ය.

(4) සෑම අධ්‍යයන මණ්ඩලයක් විසින්ම, ශාස්ත්‍රීය කමිටුවේ එකඟත්වය ඇතිව යම් නිශ්චිත කාර්යයක් සඳහා නිශ්චිත කාල සීමාවකට එක් තැනැත්තකු හෝ තැනැත්තන් වැඩි සංඛ්‍යාවක් වැඩිපුර සාමාජිකයන් ලෙස ඇතුළත් කර ගත හැකි නමුත් එසේ වැඩිපුර එකතු කර ගත් කිසි සාමාජිකයකුට ඒ අධ්‍යයන මණ්ඩලයේ ඡන්ද විමසීමකට ඉදිරිපත් වීමට හෝ එහි රැස්වීමක දී ඡන්දය දීමට හෝ අයිතිවාසිකමක් නොමැති විය යුතු ය.

17. (1) (අ) තොරතුරු පද්ධති ඉංජිනේරු විද්‍යාව
(ආ) පරිගණකය සහ බුද්ධි තොරතුරු පද්ධති
(ඇ) සංනිවේදන හා මාධ්‍ය තාක්ෂණවේද යන විෂයයන් වෙනුවෙන් අධ්‍යයන අංශ තිබිය යුතු ය.

(2) මණ්ඩලයේ නිර්දේශය මත, විශ්වවිද්‍යාලය විසින් කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව අලුතෙන් අධ්‍යයන අංශ ඇති කරනු ලැබිය හැකි ය.

(3) (අ) එක් එක් අධ්‍යයන අංශයෙහි අංශ ප්‍රධානයකු, ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරුයකු, සහාය මහචාර්යවරයකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු විය යුතු ය. ඒ සෑම ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයෙකු, සහාය මහචාර්යවරයකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකුම, උපකුලපතිවරයාගේ නිර්දේශය මත පාලක සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය.

(ආ) අංශයක ප්‍රධානයා, යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව, ඔහු පත්කරනු ලැබූ දින සිට ගණන් බලනු ලබන වර්ෂ තුනක කාලයක් ධූරය දරන අතර, ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය. සෑම අංශ ප්‍රධානයකුටම, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පාරිශ්‍රමිකයක් ලැබිය යුතුය.

(ඇ) නිවාඩුපිට සිටීම, රෝගාතුරවීම හෝ වෙනත් හේතුවක් නිසා තුන් මසකට නොවැඩි කාලයක් තම ධූරයේ කටයුතු කිරීමට අංශයක ප්‍රධානියකුට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක, ඒ කාලය තුළ ඒ ධූරයේ කටයුතු කිරීමට, මණ්ඩලය විසින් මහාචාර්යවරුන්, සහාය මහාචාර්යවරුන් හෝ ජ්‍යෙෂ්ඨ කථාකාචාර්යවරුන් අතරින් තැනැත්තකු මණ්ඩලය විසින් පත්කළ යුතු ය. එසේ වුව ද අංශයක ප්‍රධානයකු විශ්‍රාම ගන්නා විට හෝ ඉල්ලා අස්වන විට හෝ වෙනත් යම් හේතුවක් නිසා තුන් මසකට වැඩි කාලයක් ධූරයේ කටයුතු කිරීමට ඔහුට නොහැකි වූ විට, අංශ ප්‍රධාන ධූරයට, (අ) වන අනුඡේදයට අනුකූලව පත්කිරීමක් කරනු ලැබිය යුතු ය.

18. (1) පහත සඳහන් විෂය සඳහා මාධ්‍යස්ථාන පිහිටුවන ලැබිය යුතු ය :

(අ) උසස් ඩිජිටල් මාධ්‍ය තාක්ෂණය,
(ආ) ඉලෙක්ට්‍රොනික ඉගෙනුම,
(ඇ) බාහිර උපාධි,
(ඈ) පරිඝණක සේවා,
(ඉ) වෘත්තීය සංවර්ධනය.

(2) මණ්ඩලයේ නිර්දේශය පිට, කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව විශ්වවිද්‍යාලය විසින් අවශ්‍ය පරිදි වෙනත් යම් මධ්‍යස්ථාන පිහිටුවිය හැකිය.

(3) එක් එක් මධ්‍යස්ථානයෙහි, මණ්ඩලය විසින් පත්කරනු ලබන සමායෝජකයකු සිටිය යුතු අතර ඔහුට මණ්ඩලය නිශ්චය කරන ආකාරයකට පාරිශ්‍රමික ගෙවිය යුතු ය.

(4) අධ්‍යයනායතනය විසින්, අධ්‍යක්ෂවරයා එක් එක් මධ්‍යස්ථානයේ ප්‍රධානයා වශයෙන් පත්කල යුතු ය.

19. ලිත් වර්ෂය, අධ්‍යයනායතනයේ මුදල් වර්ෂය විය යුතු ය.

20 (1) අධ්‍යයනායතනයේ අරමුදලක් තිබිය යුතු ය. එම අරමුදල් වලට පහත සඳහන් මුදල් ගෙවනු ලැබිය යුතු ය.

(අ) යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට අනුකූලව අධ්‍යයනායතනයට ගෙවිය යුතු සියලු ගාස්තු,

(ආ) පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබ කොමිෂන් සභාව විසින් ප්‍රදාන වශයෙන් බෙදාදෙන සියලු මුදල්,

(ඇ) අධ්‍යයනායතනයේ බාහිර හෝ ව්‍යාප්ති ක්‍රියාකාරකම්වලින් හා සේවාවලින් උත්පාදනය වන සියලු ආදායම්,

(ඈ) පරිත්‍යාග වලින් අත්වන සියලු ආදායම්,

(ඉ) කවර වූ හෝ ප්‍රභවයකින් අධ්‍යයනායතනයට උපචිත වන වෙනත් සියලු මුදල්.

(2) ඉහත සඳහන් එක් එක් ගණයෙන් ලැබෙන ආදායම් වෙන වෙනම ගිණුම්ගත කළ යුතු ය.

(3) කිසියම් මාසයක් තුළ දී අරමුදල්වලට ගෙවනු ලබන සියලු මුදල් පිළිබඳ සාරාංශයක් අදාළ ආදායම් ශීර්ෂ යටතේ වර්ග කර ඊළඟට එළඹෙන මාසය අවසාන වීමට පෙර අධ්‍යක්ෂවරයා විසින් කොමිෂන් සභාවේ දැනගැනීම සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

21. (i) නියමාවලී මගින් නියම කරන යම් පිළිවෙලකට සහ ආකාරයකට අධ්‍යයනායතනයේ ගණන්, තැබීම,

(ii) අරමුදල්වලට ගෙවනු ලබන සියලු මුදල් භාර ගැනීම සහ එම මුදල් නිසි ගිණුම් ශීර්ෂවලට බැර කිරීම,

(iii) බලය දෙනු ලැබූ සියලු ගෙවීම් කිරීම සහ මණ්ඩලය සඳහා කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන ඇස්තමේන්තු සහ ඉදිරි එළඹෙන වර්ෂය සඳහා වාර්ෂික මූල්‍ය විසර්ජන පිළියෙල කිරීම අධ්‍යක්ෂවරයාගේ කාර්යය වන්නේ ය.

එසේ වුවද නිශ්චිත කාර්ය සඳහා කරන ලද ප්‍රදානවලින් හෝ නිශ්චිත අරමුණු සඳහා කරන ලද පරිත්‍යාගවලින් ලැබෙන ආදායම අධ්‍යයනායතනයේ ගිණුම්වල වෙන වෙනම ගිණුම්ගත කළ යුතු අතර, අධ්‍යයනායතනයේ සාමාන්‍ය කාර්ය සඳහා හෝ ඒ ප්‍රදාන හෝ පරිත්‍යාග කරන ලද්දේ පිළිවෙලින් යම් කාර්ය හෝ අරමුණු සඳහා ද ඒවා නොවන කාර්ය හෝ අරමුණු සඳහා ඒ ආදායමෙන් කිසි ගෙවීමක් නොකල යුතු ය.

22. (1) අධ්‍යයනායතනය විසින් එහි කටයුතු වලට අදාල වාර්ෂික ගිණුම් ප්‍රකාශයක් සහ සංඛ්‍යාලේඛන, කොමිෂන් සභාව, විසින් කලින් කල නිශ්චිතව නියම කරනු ලැබිය හැකි පිළිවෙලකට සහ ආකාරයකට හා එසේ නියම කරනු ලබිය හැකි විස්තර ද ඇතුළත්ව පිළියෙල කරනු ලැබිය යුතු ය.

(2) අධ්‍යයනායතනයේ ගිණුම් පොත්, අධ්‍යයනායතනයේ කාර්යාලයේ තැබිය යුතු ය.

23. උසස් අධ්‍යාපන ආයතනයක ගිණුම් විගණනයට අදාළව, පනතේ XIII වන කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අධ්‍යයනායතනයේ ගිණුම් විගණනය කිරීම කෙරෙහි හා ඒ සම්බන්ධයෙන් අදාල විය යුතු ය.

24 (1) අධ්‍යයනායතනයේ කාර්ය මණ්ඩලය, එම ආයතනයේ බලතල කාර්ය සහ කර්තව්‍ය කාර්යක්ෂමව ක්‍රියාවේ යෙදීම, කිරීම හා ඉටුකිරීම සඳහා අවශ්‍ය යයි විශ්ව විද්‍යාලයේ එකඟත්වය සහ කොමිෂන් සභාවේ අනුමතය ඇතිව ඒ ආයතනය විසින් සලකනු ලැබිය හැකි යම් නිලධරයන්ගෙන්, ආචාර්යවරුන්ගේ සහ වෙනත් සේවා නියුක්තයන් ගෙන් සංයුක්ත විය යුතු ය.

(2) අධ්‍යයනායතනයේ කාර්ය මණ්ඩලය, විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය අතරින් විශ්ව විද්‍යාලය විසින් මුදා හැරීමෙන් හෝ අවස්ථාවෝචිත පරිදි විශ්ව විද්‍යාලය විසින් හෝ කොමිෂන් සභාව විසින් පත් කිරීමෙන් සපයනු ලැබිය යුතු ය. පනතේ X වන කොටසේ විධිවිධාන, අධ්‍යයනායතනයේ කාර්ය මණ්ඩලයට පත් කිරීම් සම්බන්ධව අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතුය.

(3) විශ්ව විද්‍යාලයේ නිලධරයකු, ආචාර්යවරයකු හෝ වෙනත් සේවා නියුක්තයකු අධ්‍යයනායතනයේ සේවය සඳහා පූර්ණ කාලීන පදනම මත මුදා හැර ඇති අවස්ථාවක, විශ්වවිද්‍යාලයේ ඔහුගේ නිත්‍ය තනතුරෙහි ඔහු ලැබූ වැටුප සහ දීමනා අධ්‍යයනායතනය විසින් ඔහුට ගෙවිය යුතු ය. එසේ නොවන අවස්ථාවක දී විශ්ව විද්‍යාලය විමසා අධ්‍යයනායතනය විසින් කොමිෂන් සභාව අනුමත කළ දීමනාවක් එම නිලධරයාට, ආචාර්යවරයාට හෝ වෙනත් සේවා නියුක්තයාට ගෙවනු ලැබිය හැකි ය.

(4) අධ්‍යයනායතනයේ කාර්ය මණ්ඩලය අධ්‍යක්ෂවරයාගේ විධානයට හා විනය පාලනයට යටත් වන්නේ ය.

(5) විශ්ව විද්‍යාලයේ කාර්ය මණ්ඩලයට හා ශිෂ්‍යයන්ට අදාළවන විනය රීති සහ කාර්ය පටිපාටි, අධ්‍යයනායතනයේ කාර්ය මණ්ඩලයට සහ ශිෂ්‍යයනට අදාළ වන්නේ ය.

25. අධ්‍යයනායතනයෙහි අභ්‍යන්තර උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් සඳහා ශිෂ්‍ය සංගමයක් විය යුතු ය. පනතේ XIV වන කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අධ්‍යයනායතනයේ ශිෂ්‍ය සංගමයට අදාළ විය යුතු ය.

26. පනතේ XIX වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අධ්‍යයනායතනය විසින් සාදනු ලබන අතුරු ව්‍යවස්ථාවලට නියෝගවලට සහ රීතිවලට අදාල විය යුතු ය.

27 (1) පරිඝණක තාක්ෂණවේද ආයතනය පිහිටුවීමට අදාළව පනතේ 24අ වගන්තිය යටතේ කරන ලද අංක 471/3 හා 1987.09.14 වැනි දින දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය සහ අංක 472/2 හා 1987.09.21 වැනි දින දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද වරින් වර සංශෝධිත 1987 අංක 2 දරණ පරිඝණක තාක්ෂණවේද ආයතන නියමාවලිය, අවස්ථාවෝචිත පරිදි ඒ නියමය හා නියමාවලිය යටතේ දැනටමත් කර තිබෙන කිසිවකට අගතියක් නොමැතිව, මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) පනතේ 24අ වගන්තිය යටතේ අධ්‍යයනායතනය පිහිටුවීමේ නියමය ක්‍රියාත්මක වීමේදී පහත සඳහන් විධිවිධාන අධ්‍යයනායතනයට අදාළ විය යුතු ය.

(අ) අධ්‍යයනායතනය පිහිටුවීමේ නියමය කරන දිනයට පෙරාතුවම වූ දිනයේ දී, (මෙහි මින් ඉදිරියට 'ආයතනය' යනුවෙන් සඳහන් කරනු ලබන) පරිඝණක තාක්ෂණ ආයතනයේ සහ (මෙහි මින් ඉදිරියට 'අධ්‍යයන අංශය' යනුවෙන් සඳහන්

කරනු ලබන) විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨයේ, පරිඝණක විද්‍යා අධ්‍යයන අංශයෙන් ලියාපදිංචි වී සිටින සියලු ශිෂ්‍යයන්, මෙම අධ්‍යයනායතනයේ ලියාපදිංචි ශිෂ්‍යයන් ලෙස සැලකිය යුතු ය. ඒ සෑම ශිෂ්‍යයකුටම එකී ආයතනයේ හෝ අධ්‍යයන අංශයේ ශිෂ්‍යයන් වශයෙන් ඔවුන් විසින් භුක්ති විඳින ලද පහසුකම් සහ වරප්‍රසාද භුක්ති විඳීමට හිමිකම තිබිය යුතු ය.

(ආ) ආයතනයේ සහ අධ්‍යයන අංශයේ සේවය කරන සියලු ආචාර්යවරුන්, නිලධරයන් සහ වෙනත් සේවා නියුක්තයන් අධ්‍යයනායතනයේ ආචාර්යවරුන්, නිලධරයන් සහ වෙනත් සේවා නියුක්තයන් ලෙස සැලකිය යුතු අතර අවස්ථාවෝචිත පරිදි කොමිෂන් සභාව හෝ විශ්ව විද්‍යාලය විසින් නිශ්චය කරන, හැකිතාක් ආසන්න වශයෙන් ඒ සමාන තරාතිරමින් අධ්‍යයන අංශයේ සහ ආයතනයේ සේවයෙහි ඔවුන්ට හිමිව තිබුණු හෝ ඔවුන් විසින් භුක්ති විඳින ලද උසස්වීම්, වැටුප් හෝ වේතන, සේවය අවසන් කිරීම, දීමනා හෝ වෙනත් ප්‍රතිලාභ යනාදිය පිළිබඳ නියමයන් ඇතුළුව හැකිතාක් ඒ සමාන නියමයන් මත ඔවුන් ධූර දැරිය යුතු ය.

(ඇ) මේ නියමාවලිය ක්‍රියාත්මක වන දිනට පූර්වයෙන් ආයතනය හෝ අධ්‍යයන අංශය විසින් දරන ලද සියලු ණය, බැඳීම් හා බැරකම් ද ලියා අත්සන් කරන ලද හෝ ඇතුළත් වන ලද සියලු ගිවිසුම්, ඔප්පු, බැඳුම්කර ගිවිසුම් සහ වෙනත් සාධන පත්‍ර ද ඉටු කිරීමට භාරගන්නා ලද සියලු කාරණා හා දේවල් ද මේ නියමාවලිය යටතේ අධ්‍යයනායතනය විසින්, සමග හෝ සඳහා දරන ලද ලියා අත්සන් කරන ලද, ඇතුළත්වන ලද හා භාරගන්නා ලද සේ සැලකිය යුතු ය.

(ඇ) මේ නියමාවලිය ක්‍රියාත්මක වන දිනට පූර්වයෙන් ආයතනයට හෝ අධ්‍යයන අංශයට එරෙහිව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක්, අභියාචනයක් හෝ වෙනත් නඩු කටයුත්තක්, අධ්‍යයනායතනය විසින් හෝ අධ්‍යයනායතනයට විරුද්ධව හෝ පවරන ලද සේ සැලකිය යුතු අතර ඒ අනුව එය එසේ පවත්වාගෙන යා යුතු ය.

(ඉ) මේ නියමාවලිය ක්‍රියාත්මක වන දිනයේ දී ආයතනයට හෝ අධ්‍යයන අංශය වෙත සතු වී තිබුණු හෝ ආයතනය හෝ අධ්‍යයන අංශය විසින් නීත්‍යානුකූලව මිලදී ගෙන හෝ අත්කරගෙන හෝ බද්දට ගෙන හෝ ඊට කැමැත්තක් කරගත හැකිව හෝ තිබුණු හෝ වෙනත් ආකාරයකින් ආයතනය හෝ අධ්‍යයන අංශය වෙත පවරා දෙනු ලැබ, ආයතනය හෝ අධ්‍යයන අංශය සඳහා භාරයක් වශයෙන් දරනු ලබන හා එහි සන්තකයේ හෝ පාලනය යටතේ පවත්නා සියලු චංචල සහ නිශ්චල දේපල අධ්‍යයනායතනය විසින් හෝ අධ්‍යයනායතනය සඳහා භාරයක් වශයෙන් හෝ දරනු ලබන ලෙස සැලකිය යුතු ය.

28. අධ්‍යයනායතනයේ යම් බලමණ්ඩලයක හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක සාමාජිකත්වයෙහි පුරප්පාඩුවක් තිබීමේ හෝ ඒ සාමාජිකයන් පත් කිරීමෙහි ලා යම් දෝෂයක් හෝ දෝෂ තිබීමේ හේතුවෙන්ම පමණක්, ඒ බලමණ්ඩලයක හෝ පුද්ගල මණ්ඩලයක කිසි ක්‍රියාවක්, යෝජනා සම්මතයක් හෝ නීති කෘත්‍යයක් නිර්බල නොවිය යුතු ය.

29. මේ නියමාවලිය යටතේ විධිවිධාන කිසිවක් සලසා නොමැති යම් අනපේක්ෂිත කරුණු නිරාකරණය කර ගැනීම සඳහා විශ්ව විද්‍යාලයේ නිර්දේශය මත පියවර ගැනීමට කොමිෂන් සභාවට බලය ඇත්තේ ය.

30. මේ නියමාවලියෙහි–

"පනත" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත අදහස් වේ.

"උචිත සාධන පත්‍රය" යන්නෙන්, පනතේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය.

"ආචාර්යවරයා" යන්නෙහි, පනතේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය.

"විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත යටතේ පිහිටුවන ලද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අදහස් වේ.

"අතුරු ව්‍යවස්ථා" යන්නෙන්, පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථා අදහස් වේ.

"උසස් අධ්‍යයන ආයතනය" යන්නෙන්, විශ්ව විද්‍යාල පනතේ 24අ වගන්තිය යටතේ නියමයක් කර ඇත්තේ යම් ආයතනයක් සම්බන්ධව ද ඒ ආයතනයක් අදහස් වේ.

## නිවැරදි කිරීමයි

**1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත**

24 අ (1) වගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 24 අ (1) වගන්තිය යටතේ 2002 අගෝස්තු මස 21 දින අංක 1250/17 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයෙහි (2) වගන්තියෙහි සඳහන් "කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක අධි අධ්‍යයනායතනය" යන වචන වෙනුවට "කොළඹ විශ්ව විද්‍යාලයීය පරිඝණක අධ්‍යයනායතනය "යන වචන ආදේශ කිරීමෙන් සංශෝධනය විය යුතු ය.

කබීර් හෂීම්,
තෘතියික අධ්‍යාපනය හා පුහුණු අමාත්‍ය

2002.11.14 දින,
කොළඹ දී ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.